# මිනීමැරුම් කෙරෙහි බලපාන සමාජ සංස්කෘතික සාධක හා එහි සමාජ විද්‍යාත්මක පසුබිම (මහර බන්ධනාගාරය ඇසුරින්)

එස්. වසන්ත ප්‍රදීප් කුමාර
කැලණිය විශ්වවිද්‍යාලය
swpkumara84@gmail.com

ශ්‍රී ලංකාවේ සිදුවන සමස්ත අපරාධ අතරින් පුද්ගලයින්ට එරෙහිව සිදුවන මිනීමැරුම් බරපතල අපරාධයක් ලෙස හඳුනාගත හැකිය. සෑම සමාජයක ම පාහේ මිනිමැරුම් සිදුවන අතර, එහි අරමුණු අතින් විවිධත්වයක් දක්නට ලැබේ. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වූයේ මිනීමැරුම් කෙරෙහි බලපාන සමාජ සංස්කෘතික සාධක කවරේද? යන්නයි. මිනීමැරුම් කෙරෙහි බලපාන සමාජ සංස්කෘතික සාධක අධ්‍යයනය කිරීම අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වූ අතර, ප්‍රජා විද්‍යාත්මක සාධක මිනීමැරුම් සිදුකිරීම ට හේතු වන්නේද? මිනීමැරුම් කෙරෙහි ආර්ථික සාධක බලපාන්නේද? මිනිමැරුම් කෙරෙහි ගෘහස්ථ අරගල බලපාන්නේද? යන්න සොයා බැලීම සුවිශේෂී අරමුණු විය. පර්යේෂණයේ කේන්ද්‍රීය ගැටලුව අධ්‍යයනය කිරීමේදී විමර්ශනය කරන ලද උපන්‍යාසය වූයේ මිනීමැරුම් කෙරෙහි ප්‍රජා විද්‍යාත්මක සාධක, ආර්ථික සාධක සහ අනියම් සම්බන්ධතා බලපෑම් කරයි යන්නයි. පර්යේෂණය සිදුකිරීම සඳහා පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස යොදගනු ලැබුවේ මහර බන්ධනාගාරයයි. මිනීමැරුම් වරද සඳහා අධිකරණය මඟින් බන්ධනාගාරගත රැඳවියන් 80 දෙනෙකු අතරින් අහඹු නියැදි ක්‍රමය යටතේ රැඳවියන් 40 ක් නියැදියට ඇතුළත් කරගනු ලැබිණි. ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත පර්යේෂණය සඳහා යොදාගනු ලැබිණි. ඉහත සඳහන් කරන ලද නියැදිය තුළින් ප්‍රාථමික දත්ත රැස්කරගනු ලැබිණි. පොත්පත්, සඟරා, පුවත්පත් හා බන්ධනාගාර වාර්තා ඇසුරින් ද්විතීයික දත්ත රැස්කරගනු ලැබිණ. මෙම අධ්‍යයනය සමීක්ෂණ අධ්‍යයන ක්‍රමවේදය යන පර්යේෂණ ක්‍රමය ඇසුරින් සිදුකරනු ලැබිණි. දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම ලෙස ප්‍රශ්නාවලී ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදාගනු ලැබිණි. ප්‍රශ්නාවලී හා සම්මුඛ සාකච්ඡා මඟින් ලබාගන්නා ලද ප්‍රාථමික දත්ත ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව විශ්ලේෂණය කරනු ලැබිණි. අධ්‍යයනයට අනුව ක්ෂණික කෝපය හේතුවෙන් සිදුව ඇති මිනිමැරුම් ප්‍රතිශතය 32.5% ක් වූ අතර ඒ අනුව ක්ෂණික කෝපය මිනිමැරුම් කෙරෙහි වැඩි බලපෑමක් කළ සාධකයක් ලෙස නිගමනය කළ හැකිය. අනියම් සම්බන්ධතා හේතුවෙන් මිනීමැරුම් 10% ක් සිදුව ඇති අතර අනියම් සම්බන්ධතා මැනිමැරුම් කෙරෙහි බලපාන සාධකයක් බව ඒ අනුව නිගමනය කළ හැකිය. බීමත්කම, සමාජ සම්මතයන්ට පටහැනිව පවත්වන්නා වූ සම්බන්ධතා එනම් සමලිංගික සම්බන්ධතා, ඉඩම් අරවුල්, මුල්‍ය ගනුදෙනු, දේශපාලන අරවුල්, ස්ත්‍රී දූෂණය හා ලිංගික අතවර, දිගුකාලීන ආරවුල්, ප්‍රේම සම්බන්ධතා බිඳවැටීම් සහ පළිගැනීම යනාදි සමාජ සංස්කෘතික සාධක ද මිනීමැරුම් කෙරෙහි බලපා ඇති බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද:** අනියම් සම්බන්ධතා; ඉඩම් අරවුල්; මිනීමැරුම්; සමාජ සංස්කෘතික සාධක; ගෘහස්ථ අරගල